ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019.09.24

පැමිණිලිකරු : කේ.බී.කේ. සංජීව මයා,
799/71-D/G/02, මරදාන පාර,
කොළඹ 10.

වගඋත්තරකරුවන් :

01 විදුහල්පති,
ආනන්ද විද්‍යාලය,
මරදාන, කොළඹ 10.

02 සභාපති,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
ආනන්ද විද්‍යාලය,
මරදාන, කොළඹ 10.

03 සභාපති,
අභියාචනා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
ආනන්ද විද්‍යාලය,
මරදාන, කොළඹ 10.

04 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/123/19**

උක්ත නම සඳහන් පැමිණිලිකාර කේ.බී.කේ. සංජීව යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2019-01-09 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2019 වසරෙහි පළමු ශ්‍රේණියට ඔහුගේ දෙවෙනි පුත්‍රයා වන කලුබණ්ඩාරගේ ඔමිරු නෙතක නමැති අය වගඋත්තරකාර පාසල වන කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කළ චක්‍රලේඛ අංක 24/2018 අනුව සහෝදර පදනම මත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටීමෙන් අනතුරුව තමා විසින් ඉදිරිපත් කළ පදිංචියට අදාළ බදු ඔප්පුව ලියාපදිංචි නොවීම හේතුව මත ප්‍රතික්ෂේප කළ බවය. මේ පිළිබඳව අභියාචනා විරෝධතා මණ්ඩලයට තමන් පෝෂිත කලාපය තුළ නිත්‍ය වශයෙන්ම පදිංචි වී සිටින බවට ඔප්පු කිරීමට ඉදිරිපත් කළ අභියාචනා ලේඛන නොසලකා හරිමින් පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ බවද තම පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු –:**

සහෝදර පදනම යටතේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට තම දරුවාට ඇතුලත් වීමට ඇති අයිතිවාසිකම අහිමි කිරීම සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදු කර එම විද්‍යාලයේ 2 ශ්‍රේණියට දරුවාට ඇතුලත් වීමට ඇති අයිතිවාසිකම ලබා දෙන ලෙස මෙම පැමිණිල්ලේ සහන වශයෙන් ඉල්ලා ඇත.

ඉහත කී පෙත්සම පිළිබඳව පරීක්ෂණයක් කිරීම සඳහා පැමිණිලිකරු සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් හෝ සභාපති, අභියාචනා විරෝධතා පරීක්ෂණ කමිටුවේ ලේකම් හෝ සභාපති සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සිතාසි නිකුත් කර තිබූ අතර. ඒ අනුව පරීක්ෂණය සඳහා පැමිණිලිකරු සමග ඔහුගේ නීතීඥවරයා වන සංජීව රණවීර මහතාද වගඋත්තරකාර පාර්ශවයෙන් මෙම අයදුම්පත්‍ර පරීක්ෂා කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම්වරයා වෙනුවෙන් කටයුතු කළ එම පාසලේ ගුරුමහතා වන කේ.කේ.ජේ. උදයකුමාර යන අයද කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකරු වෙනුවෙන් ඔහුගේ නීතීඥවරයා ප්‍රකාශ කර ඇත්තේ. ඔහුගේ සේවාදායකයා වන කේ.බී.කේ. සංජීව යන අයගේ පුතනුවන්ව වගඋත්තරකාර පාසලේ 2019 වසරේ පළවෙනි ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා සහෝදර පදනම මත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටි බවයි. එහිදී අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට ඉල්ලුම්කරු පෙනී සිටි බවත්. එහිදීද පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වී ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඊට හේතු වී ඇත්තේ පැමිණිලිකරු අයදුම් පත්‍ර සමග පදිංචිය සනාථ කිරීම සඳහා බදු ඔප්පුවක් ඉදිරිපත් කළද එකී බදු ඔප්පුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නොවූ එකක් වීම බවත් සඳහන් කර ඇත. තවද පැමිණිලිකරුගේ නීතීඥවරයා සඳහන් කොට ඇත්තේ. මෙම බදු ඔප්පුවට අදාළ නිවස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මුලින් බද්දට දුන් නිවසක් වන අතර. පසුව මෙම නිවසේ පදිංචිකාරිය සමග නිවාස සංවර්ධන අධිකාරිය විසින් විකිණීමට එකග කර ගැනීමේ

ගිවිසුමක් ඇති කරගෙන තිබූ බවද එකී ගිවිසුමේ 12 වන වගන්තියේ ප්‍රකාරව නිවාස සංවර්ධන අධිකාරියේ අවසරය මත එය තවත් තුන්වන පාර්ශවයකට බදු දීමේ හැකියාවක් තිබෙන බවත්ය. ඒ අනුව එම 1 වන පාර්ශවය විසින් 2016-02-25 දින දරණ ලිපිය මගින් නිවාස සංවර්ධන අධිකාරියේ අවසර ලබා ගෙන මෙම කාරණයට අදාළ වන අංක 926 සහ 2016-11-26 දරණ බදු ඔප්පුව මගින් පැමිණිලිකරු සමග බදු ගිවිසුමකට එළඹී ඇති බවද දක්වා ඇත. ඒ අනුව එම බදු ඔප්පුව ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලබාදී ඇති නමුත් ඒ වනවිට එම බදු ඔප්පුව ලියන ලද තැනැත්තියට නිවාස හිමිකම් නොමැති වීම හේතුවෙන් එම බදු ඔප්පුව ලියාපදිංචි කර නොමැති අතර. එය නිසි පරිදි මුද්දර ගාස්තු ගෙවා අදාළ පාර්ශවයන් විසින් ඇති කර ගන්නා ලද නීත්‍යානුකූල ගිවිසුමක් වන බවත් සඳහන් කර ඇත. පැමිණිලිකරුගේ නීතීඥවරයා තවදුරටත් සඳහන් කර ඇත්තේ. එම බදු ඔප්පුව මගින් මෙම පෙත්සමේ පැමිණිලිකරුට එම නිවස බද්දට ලබා දුන් තැනැත්තිය නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලියන ලද අංක 12506 සහ 2018-06-15 දින දරණ පැවරුම්කරණය මගින් මෙම නිවසේ හිමිකාරිය බවට නීත්‍යානුකූලව පත්වී ඇති අතර. එම පැවරුම්කරය නිසි පරිදි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලියාපදිංචි කර ඇති බවත්ය. තවද මෙම තත්වය මත අදාළ බදු ඔප්පුව කිසිදු නීතිමය බාධාවක් නොමැතිව නීතිය ඉදිරියේ බලාත්මක කළහැකි නීත්‍යානුකූල ලියවිල්ලක් බව පෙනී යන බවත්. එය ලියාපදිංචි වී නොමැත්තේ ලියාපදිංචිය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට බාර දුන් අවස්ථාවේ තිබූ නීතිමය බාධාවක් හේතුවෙන් බවත්. එය පැමිණිලිකරුගේ පාලනයෙන් තොර කාරණයක් වන බවත්. එම අවස්ථාවේදීද නිවාස සංවර්ධන අධිකාරියේ නිසි අවසරය මත සකස් කරනු ලැබූ එම බදු ඔප්පුව නීතිය ඉදිරියේ බලාත්මක වන ලේඛනයක් වන බවත් සඳහන් කර ඇත. ඒ අනුව මෙම ඉල්ලුම්පත්‍රය සම්බන්ධ කාරණාවේදී ප්‍රශ්නගත බදු ඔප්පුව නීත්‍යානුකූල බදු ඔප්පුවක් බවට කිසිදු සැකයක් නොමැති අතර. යම් ඔප්පුවක් ලියාපදිංචි කිරීම තුළින් එම ඔප්පුවට කිසිදු නීතිමය වටිනාකමක් නොලැබෙන බව නීතියේ පිළිගත් සිද්ධාන්තයක් බැවින් මෙම කරුණට අදාළ සියලු ලේඛන පරිශීලනය නොකර හුදෙක් බදු ඔප්පුව ලියාපදිංචි කර නැති බව පමණක් සැළකිල්ලට ගෙන පැමිණිලිකරුගේ දරුවාට කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වීම සඳහා ලැබිය යුතු ලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම තුළින් දැඩි අයුක්තියක් හා අසාධාරණයක් සිදුවී ඇති බවත් මෙම දරුවාගේ සහෝදරයා ආනන්ද විද්‍යාලයේ අධ්‍යාපනය ලබන බවත් මෙම තත්වය මත මෙම සියලු කරුණු සැළකිල්ලට ගෙන පැමිණිලිකරුගේ දරුවාට සිදුව ඇති අගතිය සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කර දෙන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

එසේම සහෝදර පදනම මත ලකුණු 10 ක් පැමිණිලිකරුගේ දරුවා වෙත ලැබී තිබූ අතර. ඉහත කී ඔප්පුව සම්බන්ධ කාරණය පුළුල් ලෙස සියලු ලේඛන සැළකිල්ලට නොගෙන තීරණයට එළඹීම හේතුවෙන් ජන්දයට ලැබිය යුතු ලකුණු 20 ක්ද. ආසන්නතාවයට ලැබිය යුතු ලකුණු 30 ක්ද. දරුවාට අහිමි වී ඇති අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත.

මෙම පැමිණිල්ලේ ප්‍රකාශයෙන් පසුව වගඋත්තරකාර පාසල වෙනුවෙන් පෙනී සිටි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ ගුරුභවතා ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුට ඔහුගේ පදිංචි හිමිකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලේඛන ප්‍රමාණවත් නොවීම මත ඉන් ඉදිරියට ලකුණු ලබා දී නොමැති බවයි.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණ :-**

පැමිණිලිකරු ඔහුගේ දෙවන පුත්‍රයා වන කලුබණ්ඩාරගේ ඔමිරු නෙතක යන අය 2019 වසරේ කොළඹ ආනන්ද විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා 24/2018 චක්‍රලේඛයේ 6.3 අනුව දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් ගණය යටතේ අයදුම් පත්‍රය ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා මෙම පාසලේ ඉගෙනුම ලබන බවත් පැමිණිලිකරු ඔහුගේ දෙවන පුතා වන කලුබණ්ඩාරගේ ඔමිරු නෙතක කොළඹ ආනන්ද විද්‍යාලයේ මෙම ගනය යටතේ ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ. එකී අයදුම් පත්‍රය අංක BR 55 යටතේ ලියාපදිංචි වී ඇති අතර, පැමිණිලිකරුගේ වැඩිමහල් පුතා වන කේ.බී. ඔසාර තේෂක මෙම පාසලේම ඉගෙනුම ලබන බවත්, 2017 වසරේ ඔහු පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඇතුළත් කරගෙන ඇති බවත් නිරීක්ෂණය වේ. පැමිණිලිකරු මෙකී අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2018-08-18 වන දින සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටි පසු ඔහුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් චක්‍රලේඛයේ වගන්ති 6.3. i ක අනුව ලකුණු 10 ක් ලබාදී ඇති අතර, ඉන් පසුව 6.3.ii , 6.3.iii සහ 6.3.iv යන වගන්ති වලට ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බව නිරීක්ෂණය වේ. මෙහිදී සැලකිය යුතු කරුණු වන්නේ 6.3.ii වන පදිංචිය සනාථ කිරීම සඳහා වූ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ එවකට ලියාපදිංචි නොවූ බදු ඔප්පුව වගඋත්තරකරු විසින් ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූලද සහ යුක්ති සහගත ද නැද්ද යන්න පිළිබඳවය. **6.3.ii වගන්තිය ප්‍රකාරව අඛණ්ඩව ලියාපදිංචි කළ බදු ඔප්පුව (අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්ඉරු මගින් සනාථ කළයුතු අතර, බදු ඔප්පුව අවම වශයෙන් අයදුම්පත් බාර ගන්නා අවසන් දින සිට ඉදිරි මාස 6 ක් සඳහා වලංගු විය යුතුය)**

**රජයේ නිල නිවාස ලේඛනය (දෙපාර්තමේන්තු ප්‍රධානීගේ තහවුරු කිරීමේ ලිපිය) (තනිකඩ නිල නිවාස පදිංචිකරුවන් අදාළ කර නොගත යුතුය) - ගෙවල් කුළී පනත යටතේ ලියාපදිංචි වූ කුළී නිවැසියන් ලෙස සනාථ කරන ලේඛන - ලකුණු 04**

**(ලියාපදිංචි බදු ඔප්පුව ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ප්‍රකාශන ඔප්පුව වසර 10 ක් හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතුය.)**

**මෙම ගණය යටතේ පදිංචියට අදාළ ප්‍රධාන ලේඛන ඇත්නම් පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ ලෙස දක්වා තිබේ.**

ඉහත කී කරුණු වලට අනුව ලියාපදිංචි කල බදු ඔප්පුවක් නොමැති වීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වී ඇත. මෙම ලියාපදිංචි වූ බදු ඔප්පුව නොමැති වීම නිසා ඉන් ඉදිරියට පැමිණිලිකරුගේ අයදුම් පත්‍රයට ලකුණු ලබාදීමක් සිදුවී නොමැත.

පැමිණිලිකරුගේ වැඩිමහල් පුත්‍රයා මෙම වගඋත්තරකාර පාසලේ ඉගෙනුම ලබන අතර, 2017 වර්ෂයේ ඔහුට එම හිමිකම් ලැබී ඇත්තේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ බවත් මෙහිදී නිරීක්ෂණය වේ. ඒ අනුව 2016 වර්ෂය වන විටත් මෙම පැමිණිලිකරු මෙම පාසලේ පෝෂිත කලාපය තුළ ජීවත් වන බව නිරීක්ෂණය වේ. මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදී පැමිණිලිකරු අංක 799/71-ඩී/ජී/02, මරදාන පාර, කොළඹ යන ලිපිනයේ පදිංචි වී සිටින බවද, මෙම පාසලේ පෝෂිත කලාපය තුළ පැමිණිලිකරු අඛණ්ඩව පදිංචි වී සිටින බවද පැහැදිලි වේ. එබැවින් මෙම පැමිණිලිකරුට තවදුරටත් මෙකී ප්‍රදේශය තුළ ජීවත් වීම තහවුරු කිරීම සඳහා කූට ලේඛනයක් සාදා ගැනීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැත. තවද ඉහත කී අංක 926 සහ 2016 නොවැම්බර් 26 දිනැති ප්‍රසිද්ධ නොතාරිස් සරත් වී. වල්ගමගේ විසින් සාදා මුද්දර ගාස්තු ගෙවා ඇති මෙම බදු ගිවිසුම නි.තයානුකූල ලේඛනයක් හැටියට නීතිය ඉදිරියේ පිළිගත හැකි ලේඛනයකි.

තවද මෙම බදු ගිවිසුම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි නොවීම තුළ එම බදු ගිවිසුමට වටිනාකමක් නොදීම සාධාරණ නොවන බවත්. එකී කාර්යය සම්පූර්ණයෙන්ම මෙම පැමිණිලිකරුගේ පාලනයෙන් තොර කාරණාවක් බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පදිංචි වී සිටින අංක 799/71/ඩී/ජී/02, මරදාන පාර, කොළඹ 10 පිහිටා ඇති නිවස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් වන අතර, එකී නිවස 1993-12-16 දිනැති බදු ගිවිසුමකට අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නැරළුව ගමගේ පියදාස යන අයට ලබාදී ඇත.

මෙම අවස්ථාවේදී 24/2018 චක්‍රලේඛනයේ සඳහන් කල ආකාරයට "ලියාපදිංචි කල බදු ගිවිසුම හෝ ඔප්පුව" වචනයෙන් කිසිසේත්ම ලියාපදිංචි නොකල බදු ඔප්පුව පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන බවත් පෙනී යයි. තවද ලියාපදිංචි කිරීම කිසිසේත්ම එකී දේපලට වටිනාකමක් හෝ එකී ගිවිසුමට හෝ ඔප්පුවේ පිරිසිදු භාවයක් කිසිසේත් පෙන්නුම් නොකරයි. ඔප්පු දෙකක් හෝ ගිවිසුම් දෙකක් අතර යම්කිසි තරගකාරීත්වයක් තිබෙන අවස්ථාවේදී මුලින් කරන ලද ලියාපදිංචියට ප්‍රමුඛත්වය ලබාදීම පමණක් සිදුවේ.

තවද මෙම ඉහත කී දේපල පැමිණිලිකරුට අංක 926 සහ 2016 නොවැ 26 දිනැති බදු ගිවිසුමෙන් අවුරුදු 3 කට බදු පදනම මත ලබාදී ඇත. එම අවස්ථාවේදී මෙම ගිවිසුම ලියාපදිංචි නොවීමට හේතු වී ඇත්තේ. එකී දේපලේ බදුකරු වන අනුලාවතී මදනායක යන අයට ඔප්පුවක් මගින් හිමිකම මාරු වී නොමැති වීම නිසා බවද නිරීක්ෂණය වේ. පසුව අංක 12506 සහ 2018 ජූනි 15 දින ප්‍රසිද්ධ නොතාරිස් ජේකේ පුෂ්පා රෝහිනී යන අය විසින් ලියා අත්සන් කරන ලද ඔප්පුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අනුලාවතී මදනායක යන අයට බාරදී එකී දේපලේ නියම අයිතිකරු හැටියට පිළිගෙන එම දේපල කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇත. තවද මෙම දේපලේ අයිතිය වැඩිදුරටත් තහවුරු කිරීම සඳහා අංක 1123 සහ 2018 ජූනි 18 දිනැති Deed of Confirmation සකස් කර මෙම පෙත්සමේ පැමිණිලිකරුට වැඩිදුර තහවුරු කිරීම සඳහා ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ. මෙහිදී පැමිණිලිකරුගේ දරුවාව පාසලට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය ලේඛනයක් වැඩිදුරටත් තහවුරු කිරීමක් සිදු කිරීම හැර කූට ලේඛනයක් සාදා තිබීම නොවන බව නිරීක්ෂණය වේ. මෙහිදී පැමිණිලිකරු අංක 1123 දරණ Deed of Confirmation පාසලට ලබාදී තිබෙන්නේ අංක 926 සහ 2016 නොවැම්බර් 26 දිනැති බදු ඔප්පුවේ වැඩිදුර තහවුරු කිරීමක් විනා එය කිසිසේත්ම වැරදි ලේඛනයක් නොවන බව නිරීක්ෂණය වේ. එබැවින් පැමිණිලිකරුට මෙම ලේඛනයට ලකුණු ලබා ගැනීමට නීත්‍යානුකූල අයිතියක් තිබෙන බව පැහැදිලි වේ.

තවද මෙම අවස්ථාවේදී සැලකිය යුතු තවත් කරුණක් වන්නේ. මෙම පැමිණිලිකරු ඔහුගේ දරුවා වගලත්තරකාර පාසලට 2009 වසරේ ඇතුලත් කිරීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇත්තේ චක්‍රලේඛනයේ 6.3 වගන්තිය ප්‍රකාරව දැනටමත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් ගණය යටතේ වේ. මෙම ගණය යටතේ උපරිම ලකුණු වන 40 ක්ම වෙන් කර ඇත්තේ පාසලේ ඉගෙනුම ලබන ළමයාගේ දක්ෂතාවය පාසලට ලබාදී ඇති ජයග්‍රහණය, පාසලේ දියුණුව සඳහා දෙමාපියන් විසින් පාසලට දක්වන ලද විවිධාකාර සහයෝග සඳහා මිස චක්‍රලේඛනයේ 6.3.ii ට අනුව පැමිණිලිකරුගේ පදිංචියට වෙන් කර තිබෙන්නේ ලකුණු 10 ක් වේ. මෙහිදී පෙනී යන්නේ මෙම ගණය යටතේ ඉදිරිපත් කළ අයදුම් පත්‍රයක් සලකා බැලමේදී පදිංචියට නොව පාසලේ ඉගෙන ගන්නා වූ අනෙකුත් සහෝදර සහෝදරියන්ගේ දක්ෂතාවය සහ දෙමාපියන් විසින් පාසලට දක්වන්නා වූ සහයෝගයට වැඩි බරක් දී අයදුම් පත්‍රය සලකා බැලීම හැර පදිංචිය තහවුරු කිරීම පිළිබඳ ඉදිරිපත් කළ ලේඛන පිළිබඳව යම්කිසි ගැටලුකාරී තත්වයක් මතු වුනේ නම් එකී අයදුම් පත්‍රය ඉන් ඉදිරියට නොසලකා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම කිසිසේත්ම සාධාරණ නොවේ.

මෙම පැමිණිලිකරුගේ පැමිණිල්ලට අනුව මානව හිමිකම් කොමිෂන් සභාව අවධානය යොමු කර ඇත්තේ. මෙම පැමිණිලිකරු ඔහුගේ දරුවාව සහෝදර පදනම මත කොළඹ ආනන්ද විද්‍යාලයට 2019 වසරේදී ඇතුලත් කිරීම සඳහා අයදුම් පත්‍රය ඉදිරිපත් කළ අවස්ථාවේදී පාසල විසින් සලකා

බැලිය යුත්තේ එකී දරුවාගේ සහෝදරයා එම පාසලේ ඉගෙනුම ලැබීම පිළිබඳ වැඩි බරක් දීම මිස අයදුම්කරු විසින් පදිංචිය තහවුරු කිරීම පිළිබඳ ඉදිරිපත් කරන ලද ලේඛන පිළිබඳව නොවේය යන කාරණයටය. "**<u>දසනායක ගයනි ගීතිකා සහ වෙනත් අය</u>** එදිරිව **<u>ඩී.එම්.ඩී දසනායක සහ වෙනත් අය (SCFR 35/2011)</u>** නඩුවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑමවිටම පදිංචිය සනාථ කිරීම සඳහා සාක්ෂි පිහිටුවීම සම්බන්ධයෙන් සොයා බැලීමේදී සාක්ෂි තහවුරු කිරීම සඳහා දෙමව්පියන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සම්පූර්ණත්වයෙන් සලකා බැලිය යුතු බවත්, එය හුදෙක් චක්‍රලේඛයේ පමණක් සඳහන් කර ඇති නිශ්චිත ලේඛන සම්බන්ධයෙන් අදාළ කොටුව සලකුණු කිරීමේ ව්‍යායාමයක් නොවන බව තහවුරු කරගත යුතුය" වශයෙන් දක්වා ඇත. කෙසේ වෙතත් මෙම පැමිණිලිකරු ඔහුගේ පදිංචිය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ බව මානව හිමිකම් කොමිෂන් සභාවේ නිගමනය වේ

ඉහත කී කරුණු කාරණා සලකා බැලීමේදී, පැමිණිලිකරු ඉදිරිපත් කළ ප්‍රසිද්ධ නොතාරිස් සරත් වල්ගමගේ විසින් ලියා කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වූ අංක 1123 සහ 2016 නොවැම්බර් 26 දිනැති Deed of Confirmation සහ අංක 926 සහ 2016 නොවැම්බර් 26 දිනැති ප්‍රසිද්ධ නොතාරිස් සරත් වල්ගමගේ විසින් අත්සන් කළ බදු ගිවිසුම එකක් වන අතර, දෙකක් නොවන බව නිරීක්ෂණය වේ. එම ලේඛන වලින් පැමිණිලිකරු පාසලේ පෝෂිත කලාපය තුළ ජීවත් වන අතර, ඔහු බදු ගැණුම්කරු ලෙස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, පාසලේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුට ප්‍රධාන ලේඛනය නොමැති බව කියා ඔහුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන බවත් නිරීක්ෂණය වේ.

**නිගමනය -:**

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේදී, පැමිණිලිකරු ඔහුගේ දරුවාව වගඋත්තරකාර පාසලේ 2019 වසරේ පළවන ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා දැනටමත් අදාල පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් ගණය යටතේ අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එම අයදුම් පත්‍රය සලකා බැලීමේදී පෝෂිත කලාපය තුළ පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු කිරීම පිළිබඳව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කළ ඉහත කී ලේඛන නොසලකා පැමිණිලිකරුගේ අයදුම් පත්‍රය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම තුළ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පැමිණිලිකරුට හිමිව තිබූ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන කේ. ඔමිරු නෙතක දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වර්ෂයේ පළමු ශ්‍රේණියට හෝ අදාළ ශ්‍රේණියට ඇතුළත් කිරීමට පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන් වෙත මෙයින් නිර්දේශ කර සිටිමු.

2019.10.30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/R-2